# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2051/2 - 2017 දෙසැම්බර් මස 26 වැනි අඟහරුවාදා - 2017.12.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : BD/WM/ESD (2)/UO/ACQ/02.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4/3/9/2011/1R/08.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශ්‍යතාව ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:*

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, දඹවින්න පළාත කෝරළේ සුළු කොට්ඨාසයේ, දිවිතොටවෙල ගමේ මැනුම්පති විසින් පිළියෙළ කර ඇති අ.ග.පි. 55 පත්‍රයේ අංක 39, අතිරේක අංක 40 සහ 2017.10.23 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 670 ලෙස පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0450ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල.

01. **කැබලි අංක 670**

ඉඩමේ නම: ලබුතොටවෙල; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: දිවිතොටවෙල පදිංචි ඩබ්. එම්. කරුණාවතී; ප්‍රමාණය: හෙක්. 0.0450.

ඉහත සඳහන් ඉඩමට / පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය පැවරුණු අයවලුන් හෝ පහත සඳහන් දිනයේ ඒ ඉඩම කැබලි අංකය සඳහා නියම කර ඇති වේලාවට වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

| දිනය | වේලාව | ඉඩම් කැබලි අංක |
|---|---|---|
| 2018.02.23 | පෙ.ව. 9.30 | 670 |

තව ද 2018 පෙබරවාරි මස 23 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එන්. එම්. ඥානවතී,
ප්‍රාදේශීය ලේකම්,
වැලිමඩ.

2017 දෙසැම්බර් මස 20 වැනි දින,
වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01 - 256

1A - G 26847 - 27 (2017/12)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : BD/WM/ESD (2)/UO/ACQ/02.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4/3/9/2010/1R/08.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 460 වැනි පරිච්ඡේදයේ 7 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1821/26 හා 2013.07.31 දිනැති ගැසට් පත්‍රයේ ම විසින් පළ කරන ලද 7 වන වගන්තිය යටතේ දැන්වීම පහත සඳහන් පරිදි සංශෝධනය කරන බව මෙයින් දැනුම් දෙමි.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, දඹවිනි පළාත කෝරළේ දිවිතොටවෙල ගමේ පිහිටි සර්වේ ජනරාල්ගේ අංක 55 දරන අවසාන ගම් පිඹුරේ අතිරේක අංක 33හි පත්‍ර අංක 32 දරන 2013.04.29 දිනැති සංශෝධිත මූලික ගම් පිඹුරේ කැබලි අංක 623 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2527 පමණ ඉඩම් ද, සර්වේ ජනරාල්ගේ අංක 55 දරන අවසාන ගම් පිඹුරේ අතිරේක අංක 40හි පත්‍ර අංක 39 දරන 2017.10.23 දිනැති සංශෝධිත මූලික ගම් පිඹුරේ කැබලි අංක 671 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2077 පමණ ඉඩම් කැබලි වලට මායිම්.

01. **කැබලි අංක 671**

ඉඩමේ නම: ලබුතොටවෙල; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රුවන්සිරි, දිවිතොටවෙල පදිංචි කේ. එම්. සිරිසේන; ප්‍රමාණය: හෙක්. 0.2077.

ඉහත සඳහන් ඉඩමට පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම එකී හිමිකම්, අයිතිවාසිකම් හෝ සම්බන්ධකම් ඉදිරිපත් කිරීම පිණිස තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය පැවරුණු අයවලුන් හෝ පහත සඳහන් දිනයන්හි ඒ ඒ ඉඩම් කැබලි අංකය සඳහා පහත නියම කර ඇති වේලාවට වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

| දිනය | වේලාව | ඉඩම් කැබලි අංක |
|---|---|---|
| 2018.02.23 | පෙ.ව. 9.30 | 671 |

තව ද 2018.02.23 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එන්. එම්. ඥානවතී,
ප්‍රාදේශීය ලේකම්,
වැලිමඩ.

2017 දෙසැම්බර් මස 20 වැනි දින,
වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01 - 257

## ශුද්ධි පත්‍රිකාව

### 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය) 7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : කේආර්පී/එල්එන්ඩී/ඒසිකිවු VI/01/25V.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/6/2015/එච්ඩබ්ලිව්/289.

මාතර දිස්ත්‍රික්කයේ කිරින්ද - පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් විසින් අංක 1987/61 හා 2016.10.08 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයේ සඳහන් මාතර දිස්ත්‍රික්කයේ කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වලකන්ද ගමේ වලකන්ද බටහිර (327), වලකන්ද නැගෙනහිර (327බී) සහ වලකන්ද දකුණ (327 සී) ග්‍රාම නිලධාරි වසමේ ගඟබඩ පත්තුව සුළු කොට්ඨාශයේ පිහිටි සර්වේ ජනරාල් වෙනුවෙන් මාතර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක මාර 2688 හා 2016.09.14 දිනැති පිඹුරේ කැබලි අංක 1 සිට 160 දක්වා පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 10.0710 ක් වූ ඉඩම් කොටස් 132 ට අමතරව එම පිඹුරේම පහත දැක්වෙන ඉඩම් කොටස් 02 ද ඇතුළත් විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

01. **කැබලි අංක 154**

ඉඩමේ නම: මහලෙන්ලන්ද; ඉඩමේ විස්තරය: වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: –; ප්‍රමාණය: හෙක්. 0.0073.

02. **කැබලි අංක 156**

ඉඩමේ නම: මහකුඹුරේ කොස්ගහ කැබැල්ල; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: –; ප්‍රමාණය: හෙක්. 0.0044.

ආර්. එස්. එල්. චින්තක අබේවික්‍රම,
ප්‍රාදේශීය ලේකම්,
කිරින්ද පුහුල්වැල්ල.

2016 නොවැම්බර් මස 23 වැනි දින,
ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය,
කිරින්ද පුහුල්වැල්ල.

01 - 258

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.